**<u>උතුරු මැද පළාතේ පුරප්පාඩු වී ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරක් වන කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර (රාජකාරී ආවරණය) සඳහා ශ්‍රී ලංකා විදුහල්පති 1 ශ්‍රේණියේ විදුහල්පතිවරුන් තෝරා ගැනීම සඳහා සිදුකරනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ ක්‍රමවේදය.</u>**

I. අධ්‍යාපන හා වෘත්තියසුදුසුකම්.

(අ) සහ (ආ) යටතේ ලබා ඇති ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.

**(අ)** අධ්‍යාපන සුදුසුකම් (උපරිම ලකුණු 10)

| | | |
|---|---|---|
| පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධිය හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් | - | ලකුණු 10 |
| ප්‍රථම උපාධිය | - | ලකුණු 07 |
| අ.පො.ස.(උ.පෙළ) | - | ලකුණු 04 |
| අ.පො.ස.(සා.පෙළ) | - | ලකුණු 03 |

**(ආ)** වෘත්තිය සුදුසුකම් (උපරිම ලකුණු 10)

| | | |
|---|---|---|
| පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා,පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව | - | ලකුණු 10 |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව | - | ලකුණු 07 |
| ගුරු පුහුණු සහතිකය | - | ලකුණු 04 |
| පිළිගත් ආයතනයකින් ලබා ගත් වෙනත් මාස තුන හෝ ඊට වැඩි වැඩි සහතික පත්‍ර පාඨමාලා | - | ලකුණු 03 |

**(ඇ)** මේ යටතේ පහත සඳහන් සුදුසුකම් ලබා ඇත්නම් **(1)** (අ) යටතේ ලබාගන්නා ලකුණු වලට අමතරව පහත සඳහන් ලකුණු ප්‍රමාණය හිමිවේ.

**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම (මේ යටතේ ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ)**

| | | |
|---|---|---|
| 1. | ඉංග්‍රීසි උපාධි (උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ඇත්නම්) | ලකුණු 04 |
| 2. | ඉංග්‍රීසි ඩිප්ලෝමාවක් හෝ උපාධියට විෂයක් ලෙස හදාරා ඇත්නම් | ලකුණු 03 |
| 3. | අ.පො.ස. උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සමත් | ලකුණු 02 |
| 4. | තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාවම හෝ රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 6 කට වැඩි සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | ලකුණු 01 |

**තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම (මේ යටතේ ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ)**

1. තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය — ලකුණු 04
2. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවක් — ලකුණු 03
3. අ.පො.ස උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ තොරතුරු තාක්ෂණය සමත් — ලකුණු 02
4. තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාවම හෝ රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 6 කට වැඩි සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. — ලකුණු 01

**දෙමළ භාෂාව පිළිබඳ දැනුම (මේ යටතේ ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ)**

1. දෙමළ භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා — ලකුණු 03
2. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙමළ භාෂා පාඨමාලාවක් (රජයේ සේවය සඳහා අවශ්‍ය දෙවන භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා අදාළ නොවන)අ.පො.ස උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ දෙවන භාෂාව සමත් — ලකුණු 02 / ලකුණු 01
3. දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

II. පාසලේවිභාගප්‍රතිඵලඉහළනැංවීමසඳහාලබාදීඇතිදායකත්වය.

විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ලකුණු ලබා දීමේ දී වසර 03 ක විභාග ප්‍රතිඵල ඇගයීම සඳහා භාජනය කෙරේ. වසර 03 හි ප්‍රතිඵලවල සමත් ප්‍රතිශතයෙහි සාමාන්‍ය අගය සලකා ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ. ප්‍රාථමික අංශය පමණක් සහිත පාසල්, ද්විතීයික අංශය පමණක් සහිත පාසල් හා අංශ දෙකම ඇති පාසල් පවතින බැවින් (අ) හෝ (ආ) යන දෙකෙන් එකක් යටතේ පමණක් ලකුණු ලබා දේ.

**(අ)** 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය (උපරිම ලකුණු 06)

මෙම එක් එක් ලකුණු සීමාවේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව පාසලේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 50 % ඉක්මවයි නම් පමණක් අදාළ ලකුණු ප්‍රමාණය පිරිනැමිය යුතුයි.

විභාග දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති ප්‍රතිඵල ලේඛන අනුව ලකුණු 70 ඉක්මවා ඇති සිසුන් ප්‍රතිශතය (වසර 3ක සාමාන්‍ය අගය),

| | | |
|---|---|---|
| 80%ට ඉහළ | - | ලකුණු 06 |
| 70% - 79% අතර | - | ලකුණු 05 |
| 60% - 69% අතර | - | ලකුණු 04 |
| 50% - 59% අතර | - | ලකුණු 03 |
| 40% - 49% අතර | - | ලකුණු 02 |

39% ට අඩු අවස්ථාවන් වලදී ලකුණු ප්‍රදානය කරනු නොලැබේ.

**(ආ)** අ.පො.ස.(සා.පෙළ) විභාගය (උපරිම ලකුණු 06)

ගණිතය, මව්බස යන විෂයයන් සහිතව විෂයයන් 6 ක් සමඟ සම්මාන 03ක් ලබා සමත් වීමේ ප්‍රතිශතය මෙහිදි සලකා බලනු ලැබේ.

| | | |
|---|---|---|
| 80%ට ඉහළ | - | ලකුණු 06 |
| 70% - 79% අතර | - | ලකුණු 05 |
| 60% - 69% අතර | - | ලකුණු 04 |
| 50% - 59% අතර | - | ලකුණු 03 |
| 40% - 49% අතර | - | ලකුණු 02 |

39% ට අඩු අවස්ථාවන් වලදී ලකුණු ප්‍රදානය කරනු නොලැබේ.

**(ඇ)** අ.පො.ස.(උ.පෙළ) විභාගය (උපරිම ලකුණු 06)

අ.පො.ස (උ.පෙළ) පාසලේ ක්‍රියාත්මක විෂයධාරාවන්ට අදාළව විශ්ව විද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය සලකා බලනු ලැබේ.

| | | |
|---|---|---|
| 80%ට ඉහළ | - | ලකුණු 06 |
| 70% - 79% අතර | - | ලකුණු 05 |
| 60% - 69% අතර | - | ලකුණු 04 |
| 50% - 59% අතර | - | ලකුණු 03 |
| 40% - 49% අතර | - | ලකුණු 02 |

39% ට අඩු අවස්ථාවන් වලදී ලකුණු ප්‍රදානය කරනු නොලැබේ.

III. විෂයබාහිර/ විෂයසමගාමීජයග්‍රහණසඳහාලබා දී ඇති දායකත්වය (උපරිම ලකුණු 10)

අදාළ අයදුම්කරුගේ නායකත්වය යටතේ පාසල සඳහා අත් කර දී ඇති සුවිශේෂ ජයග්‍රහණ මෙහිදී සලකා බලා ලකුණු ප්‍රදානය කරනු ලැබේ. මෙහිදී පසුගිය වසර 05 ක කාලය තුල ලබාගෙන ඇති සෞන්දර්ය, ක්‍රීඩා සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලත් වෙනත් විෂය සමගාමී ජයග්‍රහණ සලකා බලනු ලැබේ.මෙම ජයග්‍රහණය අධ්‍යාපන අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව හෝ රජයේ අමාත්‍යාංශයක්/ දෙපාර්තමේන්තුවක් හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් ආයතනයක් මඟින් මෙහෙයවන අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව සහභාගි වන තරඟාවලියක දී ලද ජයග්‍රහණයක් විය යුතුය.

මෙම ලකුණු ප්‍රදානය කිරීමේ දී එක් ඉසව්වක් සඳහා ලබා ඇති උපරිම ජයග්‍රහණය සඳහා එක් මට්ටමක දී පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. විවිධ ජයග්‍රහණ සඳහා උපරිම ලකුණු 10 ට යටත් ව ලකුණු උපයා ගත හැකි වේ.

| | | |
|---|---|---|
| ජාත්‍යන්තර ජයග්‍රහණ | - | ලකුණු 06 |
| ජාත්‍යාන්තර නියෝජනය | - | ලකුණු 05 |
| ජාතික/ සමස්ත ලංකා ජයග්‍රහණ | - | ලකුණු 04 |
| පළාත් ජයග්‍රහණ | - | ලකුණු 03 |
| කලාප ජයග්‍රහණ | - | ලකුණු 02 |

IV. නිර්මාණශිලිවිශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් පද්ධතිය වෙත අත්පත් කර දී ඇති ප්‍රතිඵල(එක් විශේෂ නිර්මාණශීලී ව්‍යාපෘතියක් සඳහා ලකුණු 02 බැගින් උපරිම ලකුණු 10)

තම සේවා කාලය තුළ ආසන්නතම වසර 03 ක් තුළ ක්‍රියාත්මක කර ඇති විශේෂ වැඩසටහන්/ ව්‍යාපෘති සඳහා මෙම ලකුණු ලබාදෙනු ලැබේ. අයදුම්කරු විසින් ම ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කළ යුතු අතර, මෙම ව්‍යාපෘතිවල අදාළ අපේක්ෂිත අරමුණු ඵලදායීව ඉටුකර ගැනීමට සමත් වූයේද යන්න අදාළ විෂයය භාර අධ්‍යක්ෂ/ කොට්ඨාශ අධ්‍යක්ෂ/ කලාප අධ්‍යක්ෂ හෝ අදාළ බලධාරියා විසින් සහතික කර තිබිය යුතුයි.

එම ව්‍යාපෘති පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළව ක්‍රියාත්මකව තිබිය යුතුය.

- ශිෂ්‍ය සාධනය ඉලක්ක කරගත් වැඩසටහන්.
- ඉගෙනුම් ඉගැන්වීම හා ඇගයීම් ක්‍රියාවලිය පාසලතුල ක්‍රියාත්මක කිරීමට අදාළ විශේෂ වැඩසටහන්.
- විෂයමාලා කළමණාකරණයට අදාළ වැඩසටහන්.
- විෂය සමගාමී කටයුතු ඉහළ නැංවීමට අදාළ වැඩසටහන්.
- ශිෂ්‍ය සුභසාධනය ඉහළ නැංවීමට අදාළ වැඩසටහන්.
- නායකත්ව හා කළමණාකරණ ක්‍රියාවලියෙහි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා වූ වැඩසටහන්.
- භෞතික සම්පත් කළමණාකරනයට අදාළ වැඩසටහන්.
- පාසල හා ප්‍රජා සම්බන්ධතා ඉහළ නැංවීමට අදාළ වැඩසටහන්.

V. සේවය සඳහා ලබා ඇති ඇගයීම්. (උපරිම ලකුණු 10)

ආසන්න වසර 05 තුළදී ලබා ඇති සේවා ඇගයීම් සඳහා ලකුණු ප්‍රදානය කළ යුතුය. උපරිම ලකුණු 10ට යටත්ව ඉහළම ඇගයීම් අවස්ථා සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. (එක් කාරණයක් සඳහා ඇගයීම් සහතික නිකුත්කර ඇතිවිට ඉහළම ඇගයීම් අවස්ථාව පමණක් සලකා බලනු ලැබේ.)

| | | |
|---|---|---|
| ජාතික මට්ටමේ ඇගයීම් | - | ලකුණු 06 |
| පළාත් මට්ටමේ ඇගයීම් | - | ලකුණු 04 |
| කලාප මට්ටමේ ඇගයීම් | - | ලකුණු 02 |

VI. පාසල් අධ්‍යාපනයේ ගුණත්ව දර්ශකය (ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය - 06)

| | |
|---|---|
| 80% ට වැඩි | ලකුණු 06 |
| 70% - 79% අතර | ලකුණු 05 |
| 60% - 69% අතර | ලකුණු 04 |
| 50% - 59% අතර | ලකුණු 03 |
| 40%-49% අතර | ලකුණු 02 |
| 39% හෝ ඊට අඩු | ලකුණු 01 |

VII. ප්‍රශංසා සහ දෝෂ දර්ශන (අංක Vසේවා ඇගයීම් යටතේ ලකුණු ලබාදුන් කාරණයක් සම්බන්ධයෙන්ම වූ සේවා ප්‍රශංසා සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ)

පොදු 230 බී ආකෘතියේ ලබා දී ඇති එක් සේවා ප්‍රශංසාවක් සඳහා ලකුණු 02 බැගින් (උපරිම ලකුණු 06 කි.)

නියමිත ආකෘතියෙන් ලබාදි ඇති එක් දෝෂ දර්ශනයක් සඳහා ලකුණු 02 බැගින් අඩු කරනු ලැබේ.

VIII. පසු ගිය වසර 3 තුළ ලබා නොගත් නිවාඩු සඳහා පහත පරිදි ලකුණු ලබාදෙනු ලැබේ. අනියම්/ විවේක නිවාඩු වල එකතුවෙන්, (උපරිම ලකුණු 04)

| | | |
|---|---|---|
| ❖ ලබානොගත් නිවාඩු | 80% හෝ ඊට වැඩි | ලකුණු 04 |
| | 50% / 79% | ලකුණු 03 |
| | 25% / 49% | ලකුණු 02 |
| | 25% අඩු | ලකුණු 01 |

IX. ජ්‍යෙෂ්ඨතාවය(උපරිම ලකුණු 10)

විදුහල්පති සේවයේ සේවා කාලය වසර 1 කට ලකුණු 1 බැගින් උපරිම කාලය වසර 10 ක් සඳහා ලකුණු ලබාදිය යුතුයි.

X. සෑම අයඳුම්කරුවෙකු විසින්ම ඔබ ඉල්ලුම් කරන කොට්ඨාසයට අදාළව එම කොට්ඨාසයෙහි සුවිශේෂී අධ්‍යාපනික ගැටලු පිළිබඳව අධ්‍යයනය කර, එම ගැටලු සඳහා නිර්මාණශීලී විසඳුම් ඇතුලත් කරමින් අධ්‍යාපනයෙහි ගුණාත්මක සංවර්ධනය ඉහළ නැංවීම සඳහා නව්‍ය ප්‍රවේශයක් සහිත උපාය මාර්ග ඇතුලත් මිනිත්තු 10 ක ඉදිරිපත් කිරීමක් (PRESENTATION) සිදුකළ යුතුය.

- ලකුණු 25

- **විශේෂකරුණු**

තම සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු අතර පසුව කරන ඉල්ලීම් පිළිබඳ සලකා බලනු නොලැබේ